**ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය - 2015**

-----------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විධායක සභාවේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම විධායක සභාවේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සම්මේලනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් ලෙස ඇතුළත් විය යුතු රු.169,850 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ තොගය ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

ආයතන දහයකට ගෙවිය යුතු රු.9,134,709 ක මුදලක් වර්ෂ තුනක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන යමින් තිබුණි.

#### 2.2.3 විගණනය සහා සාක්ෂි නොවීම

---------------------------------

2015 වර්ෂයේ පවත්වන ලද තරඟාවලි 3 ක් වෙනුවෙන් සහ වෙනත් ආදායම් ලෙස ලද පිළිවෙලින් රු.925,000 ක් හා රු.208,043 ක් සම්බන්ධයෙන් අදාළ ගිවිසුම් ඇතුළු අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව සෑම මුදල් වර්ෂයක් අවසානයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් සම්මේලනය විසින් 2015 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්මේලනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,719,394 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.803,088 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,522,482 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සෘජු වියදම් රු.47,608,766 කින් අඩුවී තිබුණද ආදායම රු.52,774,107 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**4.1** **කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

සම්මේලනයේ අනුමත සේවක සංඛ්‍යාවක් සහ බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියක් නොවුනු අතර සේවකයන් වෙනුවෙන් පෞද්ගලික ලිපිගොනුද නඩත්තු කර නොතිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------------

**5.1** **අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 ඡේදය පරිදි අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයා වෙත වරන්වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) අයවැය පාලනය | අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම හැකිවන පරිදි අයවැය ලේඛනයක් සකසා නොතිබීම. |
| (ආ) ගිණුම්කරණය | ජංගම නොවන වත්කම් සහ ජංගම වත්කම් අතර නිසි වර්ගීකරණයක් සිදුකර නොතිබීම. |